www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කොටස් වෙළඳපොල ඉහල නැගීමට පටන්ගෙන ඇති නමුදු එක්සත් ජනපද ඩොලරය පල්ලම් බසියි

## Markets continue to rise but US dollar slides

**නික් බීම්ස් විසිනි**
**2007 ඔක්තෝබර් 03**

නයකර වෙළඳපොලෙහි අර්බුදයට ප්‍රතිචාර වශයෙන් එක්සත් ජනපද මහ බැංකුව පොලී අනුපාතිකය සියයට 5කින් කපා හැරීමෙන් පසු ගතවූ දෙසතිය තුල කොටස් වෙළඳපොල ඉහල නැගෙමින් තිබේ. ඔක්තෝබර් 1 දින ඩව් ජෝන්ස් දර්ශකය නව වාර්තාවක් තබමින් ඒකක 14,000කට නැගුනි. ලෝකය පුරා ඒ හා සමාන වෙළඳපොලවල නැගීමක් වාර්තා විය.

පොලී අනුපාතිකය කපා හැරීම ව්‍යාපාරවස්තු වෙළඳපොලවලට උත්තේජනයක් සපයා ඇති අතර ගෝලීය ආර්ථිකයේ ගැටලු එහි මුදුනට ම පැමිනෙමින් තිබෙන බවට පැහැදිලි සලකුනු දක්නට ඇත.

පොලී අනුපාතිකය පහත හෙලීමට මහ බැංකුව මැදිහත් වූ තැන් පටන් එක්සත් ජනපද ඩොලරයේ අගය එක දිගට පිරිහී යාම වැඩිම අවධානයට ලක්ව ඇති ක්ෂේත්‍රයයි.

දි ඉකොනොමිස්ට් සඟරාවේ ලිපියක පසුගිය සතියේ දී ප්‍රශ්නය මෙසේ ගෙනහැර දැක්වෙයි. "සාමාන්‍ය ලිස්සායාම අන්තරායකාරී පල්ලම් බැසීමක් බවට පත්වන්නේ කවදා ද?" ප්‍රධාන මුදල් ඒකකයන්ට සම්බන්ධිතව ඩොලරය නව පහල අගයක් ගෙන ඇති බව එහි සඳහන් වේ. සැප්තැම්බර් මාසය තුල එය යුරෝවට ප්‍රතිවිරුද්ධ සියයට 4.5කින් වැටුනේ මුලුමනින් ම වාගේ ඩොලර් 1.43 ක නව වාර්තාගත පහල අගයකට ලඟාවෙමිනි.

පහත වැටෙන ඩොලරය ඇමරිකානු අපනයනයන්ට උත්තේජනයක් වී ඇති අතර එය යුරෝපීය අපනයනයන් කෙරෙහි දැනටමත් දැනෙන්නට පටන්ගෙන ඇති ප්‍රතිවිරුද්ධ බලපෑමක් ජනනය කර තිබේ. ප්‍රන්ස ජනාධිපති නිකොලොස් සාකෝසි මෑතක දී සඳහන් කලේ ඩොලරයට 1.40 කට වඩා යුරෝව ඉහල නැගීම යුරෝ කලාපයේ තරගකාරිත්වයට "ගැටලුවක්" වී ඇති බවයි.

ලක්සම්බර්ග් හි අගමැති හා මුදල් ඇමති ජීන් ක්ලෝඩ් ජුන්කර් ප්‍රකාශ කලේ ගෝලීය අසමතුලිනයන් ගේ වියදම දැරීම යුරෝපයට තව දුරටත් පිලිගත නොහැකි බවයි. ඔක්තෝබර් 20 වැනි දින වොෂින්ටන්හි පැවැත්වෙන හතේ කන්ඩායමේ මුදල් ඇමතිවරුන්ගේ හා මහ බැංකු අධිපතීන්ගේ රැස්වීමේ දී මෙම ප්‍රශ්නය සාකච්ඡාවට ගත යුතු බව ඔහු කියා සිටියේ ය.

"වර්ධනයේ සේවය වෙනුවෙන් මුදල යොදා නොගන්නා එකම ප්‍රදේශය යුරෝ කලාපය පමනක් නොවිය යුතු" බව සාකෝසිගේ අදහසයි. වෙනත් වචනවලින් කිවහොත් ලෝක වෙළඳපොලෙන් යුරෝපීය අපනයනයන් බැහැර කෙරෙන තරම් ඉහලකට නැගීමට මුදලට ඉඩ නොතැබිය යුතු බවයි. යුරෝපීය මුදල උත්තේජනය කරන එතරම් ඉහලකට පොලී අනුපාතිකය නැංවීමට ද යුරෝපීය මධ්‍යම බැංකුව විසින් සිදු නොකරනු ඇත. එසේ නම් යුරෝවේ අගය තැබිය යුත්තේ කුමන පදනමක් මත ද?

සිය මුදල්වල විනිමය අනුපාතිකය හසුරුවා ගැනීමට උත්සාහ දරන මධ්‍යම බැංකු මුහුන පාන දුෂ්කරතාවන්හි මෙම ප්‍රශ්නය සෑම විටම ගැබ්ව තිබේ. කෙසේ වුවද යුරෝව සම්බන්ධ ප්‍රශ්නයේ දී එය ඒ ජාතියකට අයත් මුදලක් නොව ජාතීන් 13කට අයත් ය යන කාරනය මෙම ගැටලු තවත් සංකීර්න කරයි.

ඔක්තෝබර් 1 දින ෆිනෑන්ෂල් ටයිම්ස් හි තීරු රචක වුල්ෆ්ගැන්ග් මුන්ඩෝගේ ප්‍රකාශක සඳහන් කල පරිදි, බ්‍රිතාන්‍ය පවුම හා මධ්‍යම හා නැගෙනහිර යුරෝපීය මුදල් ඒකක රාශියකට එරෙහිව යුරෝව පිහිටුවුවහොත් ඉන් අදහස් කෙරෙන්නේ යුරෝපීය සංගමයේ අනෙකුත් සාමාජික රාජ්‍යයන්ට එරෙහි මුදල් අවප්‍රමානයන් බවයි. වෙනත් වචනවලින් කිව හොත් යුරෝව පහල වැටෙන අතර යුරෝපා සංගමයේ අනෙකුත් රටවල මුදල් ඩොලරයට ප්‍රතිවිරුද්ධව ඉහල නගින බවයි. "තනි වෙළඳපොලක් පුපුරවා හැරීමේ මීටත් වඩා හොඳ මාර්ගයක් මට සිතා ගත නොහැකි ය" යි මුන්ඩෝ සඳහන් කලේ ය.

වැටෙන ඩොලරය මගින් මතු කර ඇති අනෙක් ගැටලුව වන්නේ තමන්ගේ මුදල් එක්සත් ජනපද මුදලට ගැටගසා ඇති හා විශාල වශයෙන් එක්සත් ජනපද මූල්‍ය වත්කම්වල ආයෝජනය කර ඇති රටවල් වෙනත් අතක බැලීමට ඇති හැකියාව යි. සෞදි අරාබි ආන්ඩුව මීට පෙර සිදු කලාක් මෙන් ඇමරිකානු මහ බැංකුව පොලී අනුපාතිකය කපා හල වහාම ඒ අනුව කටයුතු නොකිරීම නිසා සැප්තැම්බර් 18 වැනි දින මූල්‍ය වෙළඳපොලවල් හරහා කම්පනයක් පැතිර ගියේ ය. මෙය සලකනු ලැබුවේ සෞදි පාලන තන්ත්‍රය සිය මූල්‍ය සංචිත එක්සත් ජනපදයෙන් පිටතට මාරු කිරීමේ හැකියාව පිලිබඳ ඇඟවුමක් ලෙස ය.

චීනයට ද මෙය දැඩි ලෙස බලපා ඇත. චීනය ඩොලරය සමග සිය මුදලේ සාම්‍යයක් පවත්වා ගනිමින් තම අපනයන වෙලඳපොලවල් ආරක්ෂා කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් දැනට වඩා වේගවත් අනුපාතයකින් එයට ඩොලර් මිලට ගැනීමට සිදුවනු ඇත. අනෙක් අතට චීනය යුආන් මුදල නැගීමට ඉඩ හරින්නේ නම් දැනට එය සතු බිලියන සිය ගනනක් වන එක්සත් ජනපද මූල්‍ය වත්කම්වලින් දැවැන්ත අලාභයක් විඳීමට එයට සිදු වනු ඇත. ඒ සමග ම එය ඩොලර් වත්කම්වලින් ඉවත්වීමට පටන් ගත හොත් එමගින් එක්සත් ජනපද මුදල ක්ෂය වී යාමක් අවුලුවා ලීමේ අනතුර ද පවතියි.

සැප්තැම්බර් 21 ෆිනෑන්ෂල් ටයිම්ස් හි කතුවැකියක් ප්‍රකාශ කල පරිදි "ඩොලරයේ පරිහානිය හෙමින් සිදුවන්නේ නම් එය පිලිගත යුතු ය. එහෙත් විදේශ ආයෝජකයන් උද්ධමනය අපේක්ෂා කරමින් ඩොලර් බිලියන 12,000ක් වන එක්සත් ජනපදයට තමන් දී ඇති නයෙන් ගැලවී යාමට පටන් ගත හොත් එය දරුනු පසුබෑමක් බවට පත් විය හැකි ය. නරකම අර්ථයෙන් නම් මහ බැංකුව කෙටි කාලයේ කුමක් කලත්, දිගුකාලීන අනුපාතිකයන් විදේශ විකුනා දැමීමට ප්‍රතිචාර දැක්වීමත් සමග මුල්‍ය ප්‍රතිපත්තිය කෙරෙහි එයට ඇති පාලනයෙන් කොටසක් අහිමි වී යා හැකි අතර ආර්ථිකය පසුබෑමකට ඇදවැටිය හැකි ය."

මුදල් හා මූල්‍ය වෙලඳපොලවල පොදු අවිනිශ්චිත භාවය පිබඳ තවත් නිදසුනක් පිලිබිඹු වූයේ සියලු වර්ගවල කඩදාසි මුදල්වලට එරෙහිව ඓතිහාසික ආරක්ෂිත වැටියක් ලෙස ක්‍රියාත්මක වූ රත්රන් පසුගිය සති කිහිපය තුල අඛන්ඩව ඉහල යමින් අවුන්සයක් වසර 28කින් වාර්තාගත ඉහලම මිල වූ ඩොලර් 743 කට දැන් පත්ව තිබීමේ කාරනය යි.

## බැංකු අලාභයන්

කොටස් වෙලඳපොලවල් උත්තේජනයක් ලබා තිබුන ද, නයකර වෙලඳපොලවල ගැටලු කිසි සේත් අවසානයකට පත්ව නැති බව පෙනී යයි. ඔක්තෝබර් 1 දින යූබීඑස් නම් ස්විස් බැංකුව තුන්වැනි කාර්තුව තුල අලාභයක් ලබා ඇති බව නිවේදනය කල අතර සිටි ග්‍රෑප් නම් ඇමරිකානු බැංකුව අනතුරු ඇඟවූයේ කාර්තුව සඳහා සිය ලාභය 2006 එම කාලය හා සසඳන විට සියයට 60 කින් පහත වැටෙනු ඇති බවටය.

ස්ථාවර ආදායම් සහිත වත්කම්වල වටිනාකමෙන් බිලියන 3.4ක් කපාහැරීමේ ප්‍රතිඵලයක් ලෙස කාර්තුව සඳහා සිය අලාභය ඩොලර් බිලියන 515ක් හා 690ක් අතර වනු ඇති බව යූබීඑස් ප්‍රකාශ කලේ ය. එම සුරැකුම්වලින් වැඩි කොටස පිටුබලය ලැබුවේ එක්සත් ජනපදයේ වැඩි අවදානම් උකස්කරයන් ගෙනි. නය මත ව්‍යාපාර මිලට ගැනීමේ පොරොන්දු මත ඩොලර් බිලියන 1.4ක් කපා හල බවටත් උකස්කරයන්ගෙන් පිටුබලය ලත් සුරැකුම්වලින් පාඩු සිදුව ඇති බවත් සිටි ග්‍රෑප් නිවේදනය කලේ ය. තුන්වන කාර්තුවේ ලාභයෙන් සියයට 60ක වැටීමක් දරා ගැනීමට එය අපේක්ෂා කරයි.

මෙම අලාභයන් අනෙකුත් බැංකු කරා පැතිරී යනු ඇතැයි අපේක්ෂා කෙරේ. පරිමාව තවමත් හෙලිදරව් කර නැතත් ජර්මනියේ ඩොයිෂ් බැංකුව අනතුරු අඟවා ඇත්තේ වෙලඳපොල කලබැගෑනියේ පහරක් තමන්ට දැරීමට සිදු වනු ඇති බවට යි.

තවද, බැංකු අලාභයන් තුන්වැනි කාර්තුවෙන් ඔබ්බට ද ගමන් කරනු ඇත. පසුගිය සතියේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) විසින් ප්‍රකාශයට පත් කල ගෝලීය මූල්‍ය ස්ථාවරත්වයේ වාර්තාවට අනුව නය අර්බුදයේ ශක්‍ය ප්‍රතිවිපාක අඩුවෙන් තක්සේරු නොකල යුතු අතර "නිවැරදි කිරීමේ ක්‍රියාවලිය දිග් ගැස්සීමට ඉඩ ඇත."

මූල්‍ය ස්ථාවරත්වයට තර්ජනය එල්ල වන්නේ, සංකීර්න නයවර සුරැකුම් වැනි මධ්‍යකාලීන ද්‍රවශීල හා අගය කිරීම දුෂ්කර වත්කම්වල මුදල් යොදවා ඇත්තේ ඉතා කෙටිකාලීන මූල්‍ය වෙලඳපොල සුරැකුම්වලින් වීම නිසා ඇතිව තිබෙන "අරමුදල් සැපයීමේ නොගැලපීමෙන්" බව වාර්තාව පෙන්වා දෙයි.

"බැංකුව තුල ඒකරාශීව ඇති නය අවදානමෙන් මූල්‍ය පද්ධතිය ආරක්ෂා කරගැනීමට පලදායී ලෙස දායක වන අතර තුර මවන ලද ව්‍යුහාත්මක නය සංසරනයට මුදා හැරීම, එනම් දිගුකාලීන නයවර විශාල ගොනුවලට රැගෙන පසුව විකුනා දැමීමේ ක්‍රියාවලිය, අවදානමේ පරිමාව හා අවසාන වශයෙන් ඒවා රඳවාගනු ඇත්තේ කොතැන්හි ද යන්න පිලිබඳ අවිනිශ්චිතතාවය ඉහල නංවන" බව ජාමූඅ වාර්තාවෙන් පෙන්වාදෙයි. මෙම " උත්පාදනය කිරීමේ හා බෙදාහැරීමේ" ආකෘතියෙහි අර්ථය වන්නේ "බොහෝ ආයතනවලට" ඔවුන් උත්පාදනය කල නය අවදානම් දැරීම අතහැර දැමීමට හැකිවන අතර එමගින් නය ගැනීම් හැසිරවීම වෙනුවෙන් ඔවුන්ට ලැබෙන දිරිගැන්වීම් ක්ෂය වී යනු ඇත" යි යන්නයි. වෙනත් වචනවලින් කිවහොත් නයකර ඉක්මනින්ම විකුනා දැමෙන බව දන්නා මූල්‍ය තැරැව්කරුවන්ට සැකකටයුතු නයකරයන්ගෙන් විශාල ප්‍රතිලාභ උපයා ගැනීමට හැකියාව ඇති වන බවයි.

කෙසේවුව ද, මවන ලද ව්‍යුහාත්මක නයකරයන් මිලට ගන්නවුන්ට බැංකු මගින් මූල්‍ය සම්පාදනය කෙරෙන තාක් දුරට එහි ප්‍රතිඵලය වන්නේ "බෙදා හරින ලද බව පෙනී යන අවදානම් ඒවා බෙදාහරින ලද බැංකු කරා විවිධ රූපාකාරයන්ගෙන් යලි පැමිනීමේ හැකියාව යි. මෙය කොතරම් ප්‍රමානයකට සිදු වනු ඇත් දැයි තවමත් කිව නොහැකි නමුත් ඩොලරයේ වැටීමත් සමග ගත් විට මෙය, එලඹෙන කාල පරිච්ඡේදයේ දී මූල්‍ය වෙලඳපලවල අස්ථාවරත්වය නිර්මානය කිරීමේ වැදගත් සාධකයක් වනු ඇත.

© www.wsws.org